# 07

# නුවරකලාවියේ නවග්‍රහ බලි ශාන්ති කර්මය

වසන්ත කේ. දිසානායක[1]


## Abstract

***The Sacrifices of the Nine Planets in Sri Lanka, is processing in the up country, low country, Sambaragamuwa, Uva and Nuwarakalaviya and it has been inherited differently identified in each of the above areas. The researches of the traditions of these sacrifices of nine planets which are processing in the up country, low countrry, Sambaragamu and Uva have already been accomplished. These sacrifices of nine planets have been nurtured by the beliefs, faiths, attitudes, values and evaluation of the people who are living in Nuvarakalaviya or Wewbendi Danawwa. These are different from the other popular sacrifices of nine planets in Sri Lanka.***

***The main objective of this study is making an analytical and complete research about Sacrifices the Nine Planets in Nuvarakalaviya. Other obljectives are as follows.***

- ***To explore the etymology of names, origin and development of the sacrifices.***
- ***To identify the reasons of the sacrifices, the ritual patterns, varieties, structure, correlations and inherited identifications, about the rituals which have been maintained orally for a long time by the exorcists***
- ***To identify the importance of these rituals to hand them down to the future generation***

***The methodology of this study was done in two ways. First one was the field studies and the second was source studies.***
***Field study:-***

1. ***Participating research***
2. ***Individual studies***

***While participating in research. I visited the places of sacrifices of the nine planets such as Abum Bali, Kada Bali and Mal Bali. Next I visited to see the overall performance and photographed them. Meanwhile recording voices and collecting information via direct interviews with exorcists and valetudinarians were done.***


---

[1] ආචාර්ය වසන්ත කේ දිසානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, dwasanta@yahoo.com

***During the individual study, I selected Nuvaraklaviya as a swatch and studied the rituals properly. Finally I have analysed the overall data about the sacrifices of the nine planets in Nuvarakalaviya.***

## *හැඳින්වීම*

''ආගම මිනිසාට ලෝකය පිළිබඳ උත්තරීතරම අනුභූතියක් (Transcendental Experience) ලබා දෙන බව'' ඒබ්‍රහම් මාස්ලෝ කියයි. (රත්නායක,2005) මානව ජීවීන් විසින් තමන්ගේ එදිනෙදා ජීවිතයේ ගැටලු විසදා ගැනීම සඳහා විවිධ ක්‍රියාකාරකම්හි නිරතව සාර්ථක ප්‍රතිඵල ලබා ගත නොහැකි වූ විට බාහිර බලවේග හෝ අධිභෞතික බලවේග මඟින් පිහිට යැදීම නිසා බිහිවන අභිචාර තුළින් අධිභෞතික හෝ අධි මානුෂික බලවේග (Supernatural Beings) තෘප්තිමත් කරමින් මානව අවශ්‍යතා සඳහා පිහිට ආධාර පැතීමට මිනිසා පෙලඹී ඇත. (හෙට්ටිආරච්චි 1965)

අභිචාර විධි අනුකරණ මන්ත්‍ර ගුරුකම් (Witchcraft) ලෙස හඳුන්වන James George Frazer මෙකී මන්ත්‍ර ගුරුකම් සමාජයට හානිදායක කටයුතු සිදුකිරීම සඳහා (Black Magic) මෙන්ම සෙත ශාන්තිය යහපැවැත්ම සඳහා (White Magic) ද ලොව පුරා ජනතාව යොදා ගන්නා බව පෙන්වා දෙයි. (Frazer,1994:62) අතීතයේ සිට ලක්දිව පැවත ආ මෙම ඇදහිලි විශ්වාස පසුකාලීනව දේව මංගල්ල ශාන්ති කර්ම දක්වා වර්ධනය වී මිනිසා සමඟ චෛන්‍ද්‍රීය බද්ධව පවතී .

තත් ක්‍රියාකාරකම් පද්ධතිය අඛණ්ඩව සම්ප්‍රේෂණය කිරීම සම්ප්‍රදාය (Tradition) නමින් හඳුන්වයි. ඕනෑම මානව සමාජයකට සර්ව සාධාරණ වූ සාම්ප්‍රදායිකත්වයක් (Traditionalism) දෘශ්‍යමාන බවත් ඒ තුළ සමස්ත සමාජයේ සමාජ දර්ශනය (Social Philosophy) ඥාන සම්භාරය (Wisdom) තාක්ෂණික ක්‍රමවේදය (Technology) සමාජයේ චාරිත්‍ර වාරිත්‍ර පද්ධතිය (Social Ethics) වතාවත් (Ritesand Ritual) ආදී වූ සියලු අංශ අන්තර් ග්‍රහණය වී ඇති බවත් පිළිගැනේ. (රත්නායක, 2005) ස්වභාව ධර්මය සමඟ සහජීවන පැවැත්මක් උදෙසා නිර්මාණය කර ගන්නා ලද සම්මුතීන් ඔස්සේ ලැබූ අත්දැකීම් හා අත්විඳීම් මත පදනම් වී උරුම කොට ගත් උක්ත දැනුම් සම්භාරයන් පරම්පරාවෙන් පරම්පරාවට වාච්‍යාර්ථයෙන් පවත්වා ගෙන එනු ලැබ ඒවා සියල්ල සම්ප්‍රදායයන් බවට පත් අයුරු ජන ශිෂ්ටාචාරයේ ස්ථර විමර්ශනය කිරීමෙන් ප්‍රත්‍යක්ෂ කොට ගත හැකිය. (ආරියපාල, 1962)

නවග්‍රහ බලි ශාන්තිකර්මය ලක්දිව උඩරට, (සේදරමන්,1967) පහතරට, (කාරියවසම්,1986) ඌව, (පියසේන ,1988) සබරගමු (කුමාරතුංග,2006) වශයෙන් පැහැදිලිව හඳුනාගත හැකි එකිනෙකට වෙනස් සම්ප්‍රදායයන්ගෙන් යුතු බලි ශාන්තිකර්මයකි. නුවරකලාවිය තුළ දක්නට ලැබෙන්නේ තත් ප්‍රදේශයටම පමණක් ආවේණික අනන්‍යසාධාරණ ලක්ෂණ රැසක් අන්තර්ගත නවග්‍රහ බලි ශාන්තිකර්මයකි. (දිසානායක,2006) එබැවින් නුවරකලාවියේ නවග්‍රහ බලි ශාන්තිකර්මයේ ඉපැරණි සංස්කෘතිකාංග හා ඒ තුළ අන්තර්ගත හර පද්ධතිය නූතන සමාජයෙන් වියැකී යාමට ප්‍රථම සංරක්ෂණය කිරීම කාලෝචිත යයි හැඟේ.

### අරමුණු

1. ප්‍රාථමික ස්වභාවික නීතිය (Natural Law) පිළිගනිමින් ඒවා ක්‍රියාත්මක කරමින් මානව අවශ්‍යතා ඉටුවන අයුරු විමසීම.
2. ගැටලු නිරාකරණය, සාමකාමීව ගැටීමේ විධි, සාමූහික ක්‍රියා (Community Action), විනිශ්චය කිරීම් (Adjudication), රෝගියාගේ අපේක්ෂා, මානසික සුව කිරීමේ ක්‍රම භාවිතය පිළිබඳ විමසීම.
3. මානසික හා සාමයික උන්නතිය උදෙසා යාතු කර්මවලින් සිදුවන සමාජ සන්නිවේදනය.
4. ස්වභාව දහම පූජනීයත්වයට පත් වන ආකාරය විමසීම
5. මෙම ශාන්ති කර්මයේ පූජා විධි රටාව ප්‍රභේද සහසම්බන්ධතා අනන්‍යතා ලක්ෂණ විමසීම.
6. සංස්කෘතික වටිනාකමකින් යුත් මෙකී යාතු කර්මවල ඇති වැදගත්කම සොයා බලා මතු පරපුරට දායාද කිරීම.

### ක්‍රමවේදය

මෙහිදී යොදාගත් මූලික ක්‍රමවේදය වන්නේ ක්ෂේත්‍ර අධ්‍යයන සහ මූලාශ්‍ර අධ්‍යයනයයි. හොරොව්පොතාන, පරංගියා වාඩිය, මැදවච්චිය, කඩවත්ගම ආදී ස්ථානයන්හි පැවැත් වූ නවග්‍රහ ශාන්ති කර්මයන් නරඹා අවශ්‍ය තැන්වලදී ඡායාරූපවලට ගැනීම, හඬපටවලට ගැනීම, යකැදුරන් හා ආතුරයන් සමඟ පැවැත්වූ සම්මුඛ සාකච්ඡා තුළින් අවශ්‍ය දත්ත සම්පාදනය කිරීම සිදුවිය.

ප්‍රාථමික මූලාශ්‍ර අධ්‍යයනයේදී ඇඳුරු පරම්පරාවන් සතුව ඇති නවග්‍රහ බලි ශාන්ති පිළිබඳ අත්පිටපත්, පුස්කොළ පිටපත්, කෝල්මුර කවි, පූජාවිධි රටාව ඇතුළත් පිටපත් හා සම්මුඛ සාකච්ඡා තුළින් ලබාගත් තොරතුරු ඇතුළත්ය. ද්විතීයික මූලාශ්‍ර වශයෙන් මේ සඳහා අදාළ මුද්‍රිත හා අමුද්‍රිත කෘති පරිශීලනය කිරීම සිදුවිය.

### නුවරකලාවියේ නවග්‍රහ බලි ශාන්තිකර්මය

නුවරකලාවිය හෙවත් වැව්බැඳි රාජ්‍යයේ වෙසෙන ජනතාවගේ ඇදහිලි විශ්වාස ආකල්ප සාර්ධරම ඇසුරින් පෝෂණය වූ නවග්‍රහ බලි ශාන්ති කර්මය දිගු කාලයක් තිස්සේ ඔවුන්ගේ ඕනෑ එපාකම් සපුරමින් පවතී. මෙම ශාන්ති කර්මය පැවැත්වීමෙන් සෙත ශාන්තිය සැලසෙන බව එම ප්‍රදේශවාසීහු තරයේ විශ්වාස කරති. (සෝමපාල, 2009) ශ්‍රී ලංකාවේ ප්‍රචලිතව ඇති අනෙකුත් නවග්‍රහ බලි ශාන්ති කර්මයන්ට වඩා විශේෂ ලක්ෂණ නුවරකලාවිය නවග්‍රහ ශාන්ති කර්මය තුළ අන්තර්ගතව පවතී.

මිනිසාට බලපාන නවග්‍රහයින් වන රවි, චන්ද්‍ර, කුජ, බුධ, ගුරු, ශුක්‍ර, ශනි, රාහු කේතු නිසා පැමිණෙන අපල, උපද්‍රව දුරිභූත කිරීම අරභයා තත් ප්‍රදේශයේ ද මෙකී ශාන්ති කර්මය පැවත්වේ. මේ තුළ දක්නට ලැබෙන විශේෂත්වය වන්නේ මෙම ප්‍රදේශයටම ආවේණික වූ පූජා විධි රටාව, පරමාර්ථ, අභින පද, වාද්‍ය භාණ්ඩ, සැරසිලි, යාදිනි, කෝල්මුර ආදියේ වූ අනන්‍යතාවයයි (දිසානායක, 2009). නුවර කලාවියට ආවේණික උක්ත ශාන්තිකර්මයේ දී ලක්දිව අනෙකුත්

නවග්‍රහ බලි ශාන්තිකර්මයන්හි දක්නට නොලැබෙන පූජාවිධි රටාව හුදෙක් යක්ෂ බලි කර්මයන්හි පූජා රටාවන් හා පවත්නා සබැඳියාව මෙහිදී අප දුටු විශේෂත්වයයි. නුවරකලාවියට අයත් දෙමළ හත් පත්තුවේ යක්බලි ශාන්තිකර්මයන්හි නියැළෙන ඇදුරන් සිටින බව මුදියන්සේ දිසානායකයන් අනාවරණය කරගෙන තිබේ (දිසානායක, 2003). කෝට්ටේ යුගයේදී වීදාගම හිමියන් හා තොටගමුවේ හිමියන් එක්ව බමුණන් අත පැවැති බලි යාග සම්ප්‍රදාය බෞද්ධ මුහුණුවරකට ප්‍රතිනිර්මාණය කළද උක්ත ප්‍රදේශයන්හි තවමත් ශේෂ මාත්‍ර වශයෙන් බමුණු යාග සම්ප්‍රදාය හා සම්මිශ්‍රිත වූ බලියාග සම්ප්‍රදායක් පවතින බවට තොරතුරු අනාවරණය කරගත හැකිය.

නවග්‍රහයින් ප්‍රධාන කොට අයියනායක දෙවියන්, පුල්ලෙයාර්, කඩවර, ශක්‍ර, බ්‍රහ්ම, විෂ්ණු, පත්තිනි, රත්න කම්බිලි, ගම්භාර, සූනියම් හා මහී මැණියන් ප්‍රධාන වූ අල්පේශාක්‍ය මහේශාක්‍ය සමස්ත දේව මණ්ඩලය උදෙසා බුලත් මඩ තබා උඩැක්කි කෝල්මුර යාදිනි මධ්‍යයේ මල් යහන් දිෂ්ටි කොට ආතුරයා හට හත් අඩියේ දෙහි කපා තුන්යාමයට සතර කොන ගොටු කැප කොට දී පැදුරේ සමයන් දී ආතුරයා පිරිත් පැනින් නාවා දේවාශිර්වාද පවත්වා අවසානයේ රිරි කඩවර ඇතුළු යකුන්ට දොළ දී නිමාකරන මෙම ශාන්ති කර්මයේ පූජාවිධි රටාව නුවරකලාවියටම ආවේණික වූ සංකීර්ණ ක්‍රියාදාමයකි(සෝමපාල,2009). අප මෙහිදී යොදාගත්තේ කල්පේ කෝරලයේ පරංගියා වාඩිය, වැලිමුවපොතාන හා මැදවච්චියේ කඩවත් ගම පැවැත්වූ කඩබලි ශාන්තිකර්මයන්ගේ දත්තයන්ය. ඇඹුම් බලි ශාන්තිකර්මය මේ ප්‍රදේශයේ අතීතයේදී පැවැතියත් වර්මානයේදී එය භාවිතයෙන් දුරස් වී ඇත්තේ ඒ සඳහා දරන්නට වන වියදම අධික වීමත් ඒ පිළිබඳ ප්‍රාමාණික දැනුමක් ලත් ඇදුරන්ගේ හිගයත් හේතුවෙනි.

## *නුවරකලාවිය නවග්‍රහ බලි ශාන්තියේ පූජාවිධි රටාව*

### *නවග්‍රහ බලි ශාන්තිය සිදුකිරීමේ පරමාර්ථය*

උක්ත ප්‍රදේශයේ නවග්‍රහ බලි ශාන්තිය සිදු කිරීමේ පරමාර්ථමය පක්ෂය ද සංකීර්ණ බවක් දරයි. කිසියම් පුද්ගලයකුගේ ජන්ම කේන්ද්‍රයෙහි නවග්‍රහයින්ගේ පාපකාරී දශා හේතුවෙන් වන මාරක, බාධක, ඒරාෂ්ටක අපල ලබා සිදුවන තුන්දොස් කිපිම, අමනුෂ්‍ය දෝෂ, දිවි දෝෂ, මහදෙවි දෝෂ, ඇවොල් දෙවොල් දෝෂ, හදිහූනියම් දෝෂ නිසා පුද්ගල ජීවිතයට සිදුවන විනාශකාරී අතුරු අන්තරා වළක්වා රෝග ව්‍යපසමනය පිණිස තත් පූජා කර්මය පවත්වා සෙතශාන්තිය අපේක්ෂා කිරීමට නුවරකලාවිය ජනයා හුරුපුරුදු වී සිටී (පියරතන නා හිමි,2009).

### *රෝග විනිශ්චය*

උක්ත රෝ දුක් වැළඳුන කල්හි බලි ඇදුරා වෙත පැමිණීමෙන් ඔහු රෝගියාගේ ජන්ම පත්‍රය පිරික්සා රෝග විනිශ්චය සිදු කරන්නේ විශේෂ පිළිවෙත් අනුගමනය කිරීමෙන් අනතුරුවයි. එනම් මන්ත්‍ර මතුරා රෝගියාට දෙහි කපා එම කැපූ දෙහි රෝගියා විසින් උස් ස්ථානයක සිට ජල බඳුනකට වැටෙන්නට සැලසීමෙන් පසු ජල බඳුනේ දෙහි පිහිටන ආකාරයෙන් රෝගවිනිශ්චය සදු කෙරේ. ඒ අනුව නවග්‍රහ බලි ශාන්තියක් කිරීමට අවශ්‍ය වූ විට ආතුරයාට ඒ බව දන්වනු ලැබේ.

### දින බේරා ගැනීම හා සමාගම් නූල පැලඳවීම

රෝග විනිශ්චයෙන් අනතුරුව ආතුරයා විසින් පඬුරු සහ බුලත් හුරුල්ලක් බලි ඇදුරාට පිළිගැන්වීමෙන් පසු දින බේරා ගැනීම සිදුවේ. එහිදී ආතුරයාට සමාගම් නූලක් පලඳවනු ලැබීමෙන් පසු ඇදුරා සහ ගෝලයෝ ද එදා සිට කිලිකුණු වලින් හා මස් මාංශයෙන් තොරව පේ වීම සිදු කරති. ආතුරයා මෙන්ම ඔහුගේ පවුලේ අයද මෙලෙසම පේ වීම සිදු කළ යුතුය. ශාන්තිකර්මයෙන් පසුව දින 21ක් පේවීම කළ යුතු වන්නේ ශාන්තිකර්මයේ නිසි ඵල ලැබීම සඳහාය.

### භාණ්ඩ ලැයිස්තුව

මෙහිදී ශාන්තිකර්මයට අවශ්‍ය භාණ්ඩ ලැයිස්තුව ඇදුරා විසින් දන්වනු ලැබේ. ඒවා පහත පරිදි වේ.
කෙසෙල් කඳන් (ශුද්ධ කරන ලද), කෙසෙල් පතුරු, ,කෙසෙල් කොළ, කෙසෙල් බඩ, ගොක් කොළ, පොල් අතු, පොල් කුරු, තල් කුරු ,කොස් කොළ.

| භාණ්ඩ ලැයිස්තුව | |
|---|---|
| නව කොළ වර්ග | ඉඹුල් කොළ, දිවුල් කොළ, කොළොන් කොළ, කරද කොළ, කොහොඹ කොළ, බෝ කොළ, වැටකේ කොළ, රඹ කොළ, නුග කොළ |
| අල වර්ග පහ | අර්තාපල් ,බතල ,මඤ්ඤොක්කා ,කටු අල, කහටංගල |
| බඩවර්ග පහ | කෙසෙල් බඩ, කිතුල් බඩ, පොල් බඩ, ඉදි බඩ, පුවක් බඩ |
| වෙරි පහ | රා, අරක්කු, කංසා, අබිං, දුං කොළ |
| පලතුරු පහ | කෙසෙල්, අඹ, බෙලි, දිවුල්, උක් ගස් |

### අනෙකුත් පූජා ද්‍රව්‍ය

සුදුමොට්ටැක්කිලියක්, පැදුරක්, නාඹර කුකුළෙක්, සුදු රෙදි දෙකක්, පච්චවඩමක්, වංගෙඩියක්, මෝල්ගහක්, බුලත් 375ක්, නොයිඳුල් කැකුළු සහල් සේරුවක්, පොල් ගෙඩි 3ක්, එළගිතෙල්, මී පැණි, එළකිරි බෝතලයක්, ග්‍රහවර්ණ 9ක්, කහ වතුර, දුම්මල, දෙහි 14ක්, ගිරයක්, හත් අඩියේ පියුම් සඳහා කෙසෙල් කඳන් 14ක්, කුරුම්බා, කැඩපතක්, හවරියක්, පනාවක්, ඉදිකටුවක්, සුර, ලෝහ පහ, (තඹ, පිත්තල, යකඩ, වානේ, කම්මල් බොර) පැන් කෙණ්ඩියක්, සෙම්බු 3ක්, පස් තෙල්, නවග්‍රහ පිදේනි තටුව ,ඇවරි කණු, පාවඩ, නැවුම් හට්ටියක්, පස් පැඟිරි දර (දෙහි, දොඩම්, නාරම්, කුඩලු, යකිනාරම්)

### නවග්‍රහ ශාන්තිය පැවැත්වෙන දා ආතුර නිවසේ වත්පිළිවෙත්

නවග්‍රහ ශාන්තිය පැවැත්වෙන දිනයේ ආතුර නිවසේ වත් පිළිවෙත් රැසක් සිදු වෙයි.

### දේවාභරණ වැඩමකරවීම

ප්‍රධාන කපු මහතා ඇතුළු අවශේෂ කපු මහත්වරු පූජා කර්මය පවත්වන දා ආතුර නිවසට දේවාභරණ වැඩමවා තේවා කෙම්මුර පවත්වති.

### පේ බත පිළිගැන්වීම

ප්‍රධාන කපු මහතා ඇතුළු අවශේෂ කපු මහතුන් හා පැමිණ සිටින සියලුම ගම්වාසීන් උදෙසා ආතුර නිවසේ පේ බත නමින් මහා දානයක් සකස් වෙයි. මෙහිදී සම්ප්‍රදායානුකූලව වතුර නම්බු කිරීම, නැමි ඇතිරිලි මත දානය පිළිගැන්වීම සඳු කරන්නේ මහත් ගෞරව භක්තියෙනි.

### මූලික සැරසිලි සැකසීම

පේ බත අනුභවයෙන් පසුව ශාන්තිකර්මයට අවශ්‍ය මූලික සැරසිලි සකස් කිරීම ඇරඹේ.

### යාග මඩුව සැකසීම

පොල් අතු ගොක් අතු හා රඹ කදන් උපයෝගී කරගනිමින් ආතුර නිවසේ ඉදිරිපස දිග අඩි 30ක් ද පළල අඩි 15ක් ද පමණ වූ යාග මඩුව සකසන්නේ සුභ මුහුර්ති බලා සඳුන් කිරිපැන් ඉස, භූමිය ශුද්ධත්වයට පත් කිරීමෙන් අනතුරුවයි. උඩු වියන් බැඳ එහි නව කොළ අතු එල්ලා අවසානයේ දුම්මල කීල ගසා දේව පූජාවකට සුදුසු පරිදි යාග මඩුව සකස් කරන්නේ විචිත්‍ර අයුරිනි. නවග්‍රහ ශාන්තියේ කුඩු මහත් සියලු කටයුතු සිද්ධ කරන්නේ උක්ත යාග මඩුව තුළදීය.

### ප්‍රධාන දේව යහනට මැසි බැඳීම

තල් පිති, රඹ පතුරු හා ගොක් කොළ උපයෝගී කරගනිමින් අඩි 3 1/2ක් උස රියන් 3ක් පළල රියන් 5ක් දිග මැස්සක් යාග මඩුව මධ්‍යයේ සකසන්නේ ප්‍රධාන දේව යහන උදෙසාය. මැසි බැඳීමෙන් පසුව සඳුන් කිරිපැන් ඉස දුම්මල අල්ලා පාරිශුද්ධත්වයට පත් කරයි. ලක්දිව වෙනත් කිසිදු ප්‍රදේශයක මෙලෙස දෙවියන් උදෙසා යහන් දීම සිදු නොකරන හෙයින් නුවරකලාවියටම ආවේණික තත්ත්වයක් මෙකී පූජාවිධි රටාව තුළ දක්නට ලැබීම විශේෂත්වයකි.

### ප්‍රධාන දේව යහන සැකසීම

යාග මඩුව මධ්‍යයේ ඉදි කළ දේවයහන් මැස්සේ ප්‍රධාන දේව යහන සකස් කිරීම සිදුවේ. මෙම යහනේ ප්‍රධාන දේව යහන් තුනක් දක්නට ලැබේ. ඒ මධ්‍යයේ ගණදෙවියන්ගේ යහනත්, දෙපස රත්න කම්බිලි හා කළු කම්බිලි යහනත් වශයෙනි.

ප්‍රධාන කපු මහතා නා පිරිසිදු වී හිසේ ජටා බැඳ මුඛවාඩම් බැඳ ප්‍රධාන යහන සැකසීම ආරම්භ කරයි. දුම්මල කීල ඇල්ලූ අක්යාල සුදුකැකුළු හාල්, සඳුන් කිරිපැණින්, පිරිසිදු කළ බලි මැස්ස මධ්‍යයේ සහ දෙපස කොටස් තුනක් වශයෙන් නවවැඳුම් වැඳ තැන්පත් කරන්නේ මධ්‍යය ගණ දෙවියන් උදෙසාත් දෙපස රත්න කම්බිලි හා කළු කම්බිලි දෙවියන් උදෙසාත්ය.

### ගණ දෙවියන්ගේ මඩය හෙවත් ගණ දෙවි යහන

මහ යහන මධ්‍යයේ වූ අක්යාල හාල් මත කහදියෙන් නහවා දුම්මල කීල ඇල්ලූ බුලත් තැන්පත් කරයි. ඒ මත පැන් සෙම්බුවක් තබන්නේ පොල් මල් කිනිති තුනක් හා අඹ කොළ තුනකින් සැරසීමෙන් පසුවයි.

පොල් ගෙඩියක් මුදුන් අතට සිටින සේ සෙම්බුවේ තැන්පත් කරන අතර පොල් ගෙඩිය මුදුනේ බුලත් කොළ තුනක් සලඹක් හා රත් මල් වේ. එය ගොක් කොළ වලින් අලංකාර කිරීමද සිදුවේ. අනතුරුව පස් මල්, පස් පළතුරු, කැවිලි පහ, ආදිය ඒ වටා තැන්පත් කරනු ලැබේ.

### දෙපස කම්බිලි යහන්

ගණ දෙවි මඩය දෙපස කැවිලි පලතුරු ආදියෙන් යුත් ගොටු සහිතව සෙම්බු දෙකක් තැන්පත් කරන්නේ රත්න කම්බිලි හා කළු කම්බිලි දෙවියන් වෙනුවෙනි.

### මහ යහන

ගණ දෙවියන්ගේ හා කම්බිලි දෙවියන්ගේ යහන් අබියස එක් පේළියකට 6ක් ද අනෙක් පසට පේළියකට 3ක් ද වන සේ බුලත් යහන් 18ක් (අල්ලි 18ක්) නිර්මාණය කරන්නේ විෂ්ණු, බ්‍රහ්ම, ඊශ්වර, ශ්‍රියා කාන්තාව ප්‍රමුඛ සියලුම දේව මණ්ඩලය උදෙසා ය. මෙම යහන් පොල් මල් කිනිතිවලින් බෙදා වෙන් කොට ඇත. සෑම යහනක්ම පුවක්, පලතුරු, කැවිලි, මල්, පිනිදිය, සඳුන්, කපුරු සාම්බ්‍රාණි ආදී පූජා ද්‍රව්‍යයන්ගෙන් සකස් කර ඇත. මේ මගින් සියලුම දේව මණ්ඩලය වැඩමකරවීමට අවශ්‍ය පවිත්‍ර පාරිශුද්ධත්වයෙන් යුත් දේවමණ්ඩපයක් ලෙසට මහ යහන සැකසේ.

### සූනියම් දෙවියන්ගේ යහන

ප්‍රධාන යහනට දකුණු පසින් සූනියම් දෙවියන් උදෙසා යහනක් සකස් කරනු ලැබේ. නවග්‍රහ ශාන්තියේදී සූනියම් දේවතා යහනක් සකස් කරන්නේ ආතුරයාට හෝ ආතුර නිවසට හදි හූනියමක් සිදු කර ඇත්තේ වී නම් එයින් ආතුරයා සහ නිවැසියන් ආරක්ෂා කර ගැනීම පිණිසයි. නවග්‍රහයින්ට දොළපුද දී එකී දෝෂ ඉවත් කළද ආතුරයාට හෝ ආතුර නිවසට හදි හූනියම් කොඩිවින බන්ධන ඉරිපැන්නුම් කර තිබේ නම් ඉන් ආතුරයා ට සිදුවන ජීවිත හානි වළක්වා ආරක්ෂා කරගැනීම උදෙසා සූනියම් දේවතා යහන දෙනු ලැබේ. බුලත්, පුවක්, මල්, පහන්, සුවඳදුම්, පස් පුළුටු සහිත ගොටු නවය හා කකුළු බිල්ලක් සහිතව මෙම යහන සකස් වේ.

### සතර වරම් දෙවියන්ගේ යහන

ආතුර වාසස්ථානයේ සතරවරම් දෙවියන් උදෙසා වත්තේ සතර මායිම්හි සිව් දිශාවන්ට මුහුණලා යහන් 4ක් සකස් කරන්නේ ආතුර වාසස්ථානයම හතරවරම් දෙවියන්ගේ ආරක්ෂාවට යටත් කරමිනි. මෙහිදී සතරවරම් දෙවියන් ලෙසට හඳුන්වන්නේ නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි දෙවියන්ය. බුලත්, පුවක්, කැවිලි, පස් පලතුරු, හා කුරුම්බාවක් තබා යහන සකස් කරනු ලැබේ.

### දේවාභරණ සහිත යහන

දේවාලයෙන් වැඩමකරන ලද දේවාභරණ තැන්පත් කිරීම උදෙසා වෙනම බුලත් යහනක් සකස් කරනු ලැබේ.

### නවග්‍රහ මඩය හෙවත් නවරත්න මඩය

මහ යහන හා සූනියම් දේවතා යහනට අතර කනප්පුවක් මත සකස්වෙන නවග්‍රහ මඩය හෙවත් නවරත්න මඩය උක්ත ශාන්තිකර්මයේ සුවිශේෂ පූජාවක් ලෙස සැලකිය හැකිය. බුලත් 50ක් හා පුවක් 50ක් යොදා තනි අල්ලියට සිටින සේ සකස් කරනා බුලත් යහනේ නෙළුම් මල්, පස් පලතුරු, කැවිලි පස් වග යොදා සරසනු ලැබේ. පිරිසිදු කළයක් ගෙන ඊට ධාන්‍ය පහ (තල, මුං, වී, විලඳ, කපු ඇට) සුදු හඳුන්, නව දිය (**කුඹුක්ගැට දිය, කදුරුකෙටිය දිය, දියලබු වැල් දිය, ලිං දිය, වැව්දිය, ගං දිය, පුහුවලේ දිය, ගල්වලේ දිය, අට්ටික්කා මුලේ වතුර**) හා නවග්‍රහයින්ට අදාළ නව රත්න එකතුකර ගොක් කොළ, පොල් මල්, පුවක්මල් හා රත්මල් යොදාගනිමින් පුන්කලසක ආකාරයෙන් සරසා පෙර දී සකස් කරන ලද බුලත් යහනේ තැන්පත් කරනු ලබන්නේ ශාන්තිකර්මය අවසානයේදී මෙකී ශුද්ධ ජලයෙන් ආතුරයා නහවනු පිණිසයි.

### ශ්‍රියා කාන්තා මඩය

සුදු පිරිවටයක් මත බුලත් 12ක් හා පුවක් 12ක් සහිත බුලත් යහනක් සකසා කැවිලි පස්වග, පලතුරු පස්වග, පංචවර්ණ මල්, සඳුන් පිනිදිය, පහනක්, කඩපතක්, පනාවක් හා හවයක්, ද ඒ මත තැන්පත් කරන්නේ ශ්‍රියා කාන්තා දේවීන් වහන්සේ සඳහාය.

### මල් විල

අලුත් කොරහක් ගෙන ඊට පිරිසිදුව පෙරාගත් ජලය හා මල් වර්ග 5ක් එක් කර ආතුරයා දෙපස තබන්නේ මොට්ටැක්කිලි ඇරි පසු ආතුරයාට නවග්‍රහ දෙවියන් දැකීමත් සමඟම මල් විල බැලීමට සලස්වා ආතුරයාගේ වස් දොස් පහ කිරීම උදෙසාය.

### අටමඟලය

තත් ශාන්තිකර්මයේ දී ආතුරයාගේ දෙපා අබියස තැබීම උදෙසා අටමඟල සකස් කරයි. පැදුරක් එළා ඒ මත පන් මල්ලක් තබා ඒ මත සහල් අතුරා අටමඟලය ඇඳ දිවිහිස, මෝල්ගහ, තොලබෝ, හීරැස්ස පළු, ඊ තණ හා පොල් ගෙඩියක් තැන්පත් කර අටමඟල සාදන්නේ ආතුරයාගේ වස්දොස් දුරු කරනු පිණිසයි. මෝල් ගහ ආතුරයාගේ දෙපයටත් වංගෙඩිය පිටටත් හේත්තු වනසේ තැබීම මෙහි විශේෂත්වයකි.

### පැන්බත් තැටි

කඩතුරා හැර නවග්‍රහ මණ්ඩලය දෙස බලන ආතුරයාගේ හිත කිසියම් බියකින් කම්පනයට පත් වුවහොත් ඉන් සිත තැන්පත් කර වස් දොස් පහකිරීම පිණිස පැන්බත් තැටි රැගත් කන්‍යාවෝ ආතුරයාට සෙත් පැතීම සිදු කරති. පිරිසිදු තැටි දෙකක් රැගෙන කහ සමඟ පොල් මිශ්‍ර කොට කතිරයට තැබූ රඹ පතුරු මත තබා පත්තු කරන ලද පහන් තිර ආතුරයාගේ හිසවටා තෙවරක් කරකවා පැන්බත් තැටි මතට දමන්නේ ආතුරයාගේ සියලු දොස් පහව යන්නට ආශිර්වාද කරමිනි.

## කඩ බලිය හෙවත් නවග්‍රහ මණ්ඩලය

ඇඹුම්බලි ශාන්තියක් කිරීමට අවශ්‍ය මිල මුදල් හිඟ වු විට කඩබලි ශාන්තිය කරනු ලැබේ. එහිදී පිරිසිදු රෙදි කඩක සිතුවම් කරනලද නවග්‍රහ මණ්ඩලය ශාන්තිකර්මය සඳහා යොදා ගැනේ. මහයහනට ඉහළින් ආතුරයාට මුහුණලා මෙම කඩබලිය එල්ලා තබයි.

### *ආතුර අස්න*

මහ යහනට හා නවග්‍රහ මණ්ඩලයට මුහුණලා සුදු පිරුවටයක් සහිත පැදුරක් මත ආතුරයාට වාඩිවීමට සලස්වන්නේ කපු අම්මලා දෙදෙනෙකු දෙපස රඳවමිනි. පැන්බත් තැටි අතින් ගත් ඔවුහු ආතුරයාට ආ වැඩීම සිදු කරති.

### *හත් අඩිය සකස් කිරීම*

මැණික්පාල දේවීන් වහන්සේට ඔඩ්ඩි යක්ෂයා වින කළ හෙයින් ඒ සඳහා සිදු කළ ශාන්ති කර්මය වන්නේ හත් අඩිය ශාන්තියයි. එනමුත් නුවරකලාවිය නවග්‍රහ බලිශාන්තියේදි ද හත්අඩියේ දෙහිකපා ආතුරයාට ශාන්ති කිරීම විශේෂත්වයකි.

සිදුහත් උපතේදී සත් පියුම් මත උතුරට වැඩීම සිහිගන්වන පිණිස කෙසෙල් බඩයක් උස අනුපිළිවෙළට කොටස් 7කට කපා ගොක්කොළවලින් සරසා පියුම් 7ක් ලෙස සකසා ගනී. වියත් 5ක් දිගැති කෙසෙල් පිති දෙකකින් ඇතුරු අළු මැදිවන සේ දෙපස තබා වියතක් දිගැති කෙසෙල් පතුරු 7ක් මගින් කොටස් 7කට වෙන් කරයි. එක් එක් කොටස මත සැකසු පියුම් 7ක් උස අනුව තබනු ලැබේ. බුලත් 7ක්, දෙක බැගින් දෙහි ගෙඩි 14ක්, සප්ත වර්ණ මල් 7ක්, පඬුරු 7ක්, පස්පුළුටු සහිත බත් ගොටු 7ක්, පහන් තිර 7ක් ද තබනු ලැබේ. පස් පැඟිරි දර පුළුස්සා සැකසු අළු අළුවන් වැඩීම සඳහා යොදා ගැනේ. ගිරයක් ද එක් කරන්නේ පූජා කර්මය අවස්ථාවේ දි ආතුරයාට හත් අඩියේ දෙහි කැපීම සඳහාය.

### *ගොටු සහ තටු සැකසීම*

ප්‍රධාන දේව යහන් සකස් කිරීමෙන් අනතුරුව නවග්‍රහ ශාන්තියේදී පුද ලබන දෙවි දේවතාවුන් හා යක්ෂයින් විෂයෙහි පුද කරන පිදේනි ගොටු සහ තටු සැකසීම සිදුකරයි.

### *නවග්‍රහ දෙවියන් උදෙසා තටු සැකසීම*

| ග්‍රහදෙවි නාමය | වර්ණය | විමානය | තටුව |
|---|---|---|---|
| සෘවි | රතු | ඉඹුල් | සඳුන්, කොකුම් මිශ්‍ර කිරිබත් තටුව |
| චන්‍ද්‍ර | කොළ | දිවුල් | උදු බත් |
| කුජ | රතු | කොළොන් | |
| බුධ | කොළ | කොහොඹ | |
| ගුරු | කහ | බෝ | |
| ශුක්‍ර | සුදු | කරඳ | එළගිතෙල්සහිත කිරිබත් |
| ශනි | නිල් | නුග | |
| රාහු | සුදු පාට | වැටකේ | තලකිරිබත් |
| කේතු | පඬු පාට | රඹ | |

ප්‍රධාන කපු මහතා ඉතා පිරිසිදුව පිසින ලද කිරි අහර මුඛවාඩම් බැඳ ඒ ඒ ග්‍රහදේවතාවන්ට විශේෂිත වූ පූජා ද්‍රව්‍ය, වර්ණ හා විමානයට අයත් පත්‍රද එක් කරමින් නවග්‍රහ තටු නවය සකසා නවරත්න මඩය වටා තැන්පත් කරයි.

### නවග්‍රහ පිදේනිය හෙවත් නවග්‍රහ ගොටු නවය

නවග්‍රහ යක්ෂයින් උදෙසා සකස්වන මෙම පිදේනිය නුවරකලාවියට සුවිශේෂ වුවකි. කෙසෙල් කොට, කෙසෙල් පතුරු හා ගොක් සැරසිලිවලින් අලංකාර වූ නවග්‍රහ පිදේනියේ ගැබ් නවයකි. පස් පුළුටු, සහිත ගොටු නවය ගැබ් නවයෙහි තැන්පත් කර පුදනු ලැබේ.

### දොළොස් කඩවර ගොටු

නුවරකලාවියේ වැසියෝ කඩවර දෝෂය පිළිබඳ දැඩි විශ්වාසයකින් කටයුතු කරති. තත් ප්‍රදේශයේ ඕනෑම පුදපූජාවක දී කඩවර දෙවියන් උදෙසා යහන් පහන් දිම අනිවාර්ය කටයුත්තක් සේ සිදු කරන්නේ එබැවිනි. නවග්‍රහ බලිශාන්තියේදී කඩවර යක්ෂයින් උදෙසා දොළොස් කඩවර ගොටු සකස් කරනු ලැබේ. අල පහ, බොඩ පහ, හත් මාළුව, රත් ඇඹුල් සහිත කිරිබතින් ගොටු අටක් සකසා ඉතිරි ගොටු හතර ලේ ගොටුව, මල් ගොටුව, කිරි ගොටුව හා පුළුටු ගොටුව ලෙස සකස් කරති.

### දළ කඩවර ගොටු දෙක

සෙනෙවිරත්න මුල්කඩවර උදෙසා කිරිබත්, කැවිලි, කෙසෙල්ගෙඩි, හත් මාළුව, පස් පුළුටු, රත් ඇඹුල් ,අල පහ, බොඩ පහ, සඳුන් පිනිදිය, හා මල් පහ ආදියෙන් යුක්තව ගොටු දෙකක් සකස් කෙරේ.

### සූනියම් දෙවියන්ගේ ගොටු නවය

කදුරු කණුවක් පාමුල ත්‍රිවර්ණ රෙදි කඩක බුලත් ගොණු 9ක් මත කොස්කොළ වලින් සකස් වූ කිරිගොටුව, මල් ගොටුව, ලේ ගොටුව, පුළුටු ගොටුව, අඳුන් ගොටුව, සඳුන් ගොටුව, තෙල් ගොටුව, දුම්මල ගොටුව, වෙරිපහ සහිත ගොටු 9ක් පුද දෙයි. ඊට කුකුළු බිල්ල සහ කුරුම්බාවක් ද එක් කරනු ලැබේ. කදුරු කණුව මත තබන සූනියම් ගොටුව සකස් වන්නේ එළවළු 7ක්, දියගොඩ මස්, රත් ඇඹුල්, අල 5, සහිත පස් පුළුටින් යුක්තවයි. පහන් දල්වා දුම්මල කීල අල්ලා දිෂ් ටිකර මෙකී යහන සූනියම් දෙවියන්ට පුද දෙනු ලැබේ.

### කම්බිලි ගොටු

රත්න කම්බිලි හා කළුකම්බිලි දෙවියන් උදෙසා මහයහනේ සෙම්බු දෙකක් මත තැන්පත් කිරිමට මෙම ගොටු සාදයි.

### පූජා විධි රටාව

මුලික සැරසිලි  දේව යහන් හා ගොටු තටු සකස් කිරීමෙන් අනතුරුව පූජා කර්මය ආරම්භ කරනු ලැබේ.

### ශාන්ති කර්මයේ ආරම්භය

ප්‍රධාන කපු මහතා ප්‍රමුඛ සියලු ඇඳුරෝ ඉස්සෝදා නා පිරිසිදු වී යාග මණ්ඩපයට පැමිණ යාග මණ්ඩපය සඳුන් කිරිපැන් හා කහ දියර ඉස දුම්මල

කීල අල්ලා පවිත්‍ර කරති.

*පහන් දැල්වීම (කෙම්මුර කිරීම හෙවත් තේවාව)*

නුවරකලාවියේදී කෙම්මුර කිරීම හෙවත් තේවාව කිරීම යනුවෙන් හඳුන්වන්නේ බුදුන් දෙවියන් හා අනෙකුත් බලවේග විෂයෙහි පහන් දැල්වීමයි.

*තුනුරුවන් උදෙසා කෙම්මුර කිරීම*

ආතුර නිවසේ ප්‍රධානියා තුනුරුවන් උදෙසා පහන් දැල්වීම සිදු කරන්නේ ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදයෙන් තම නිවැසියන්ට වැලඳී ඇති සියලු රෝග නිවාරණය වී සෙතශාන්තිය සැලසේවා යන අධිෂ්ඨානයෙන් යුක්තවයි.

*දෙවියන් උදෙසා කෙම්මුර කිරීම*

වට පහන් දැල්වීම වශයෙන් හැඳින්වෙන මෙහිදී සතරවරම් දෙවියන්, ශාසනභාර දෙවියන්, සෙනෙවිරත්න මුල් කඩවර, ශ්‍රියා කාන්තාව, නවග්‍රහ ආදී වූ සියලුම දෙවිදේවතාවුන් විෂයෙහි පහන් දල්වා තේවා කෙම්මුර සිදු කරයි.

*යක්ෂයින් උදෙසා පහන් පත්තු කිරීම*

නවග්‍රහ, කම්බිලි, කඩවර, සූනියම් ආදී යක්ෂයින් සඳහාද පහන් දැල්වීම තත් ප්‍රදේශයේ විශේෂත්වයකි. ඒ මඟින් උක්ත අමනුෂ්‍ය බලවේග තුළින් කිසිවකුට අනතුරක් නොවේ යන්න විශ්වාසයයි.

*හැන්දෑ සමයම ආරම්භ කිරීම*

තුනුරුවන්, දෙවියන් හා යක්ෂයින්හට නියම වූ යහන් ආලෝකමත් කිරීමෙන් අනතුරුව සියලු ගුරුන්නාන්සේලා තුප්පොට්ටියෙන් සැරසී උඩැක්කි අතැතිව යාග මණ්ඩපයට බැස සංඛ නාද හා මඟුල් බෙර වාදන සහිත ශබ්ද පූජා මධ්‍යයේ සුවඳ දුම් අල්ලා තේවා මුර ආරම්භ කර දේවාරාධනාව සිදු කරති.

"ඕං නමක් ශ්‍රී සනාය......."

දෙවියන්ගෙන් වරම් ගෙන ආශිර්වාද ලබා මල් පද ,කොතල පද නැටීම ඇරඹේ.

*මල් යහන් කවි (කෝල්මුර ගායනා)*

එක් එක් දෙවියන්හට කෝල්මුර කවි කියා යහනට කැඳවීම මෙහිදී සිදුවේ. එහිදී දෙවියන් බැහැදැකීම අනිවාර්ය කටයුත්තක් ලෙස සැලකේ.

1. කම්බිලි දෙවියන් යහනට කැඳවීම
2. කඩවර දෙවියන් යහනට කැඳවීම
3. සූනියම් දෙවියන් කැඳවීම
4. සියලු දෙවියන් යහනට කැඳවීම

### ආතුරයා යාග මණ්ඩපයට කැඳවීම

මොට්ටැක්කිලියෙන් වැසූ ආතුරයා කැඳවාගෙන පැමිණ යාගමඩුවේ ආතුර

වාසස්ථානයේ වඩා හිඳුවන මේ අවස්තාවේදී කෝල්මුර ගායනය සිදු කිරීමට ඇදුරෝ අමතක නොකරති.

### අටමඟලට කවි කීම

අටමඟලට කවි කියා ආතුර පාදස්ථානයේ තැබීම සිදු කෙරේ.

### හත් අඩිය තැබීම

අනතුරුව හත් අඩිය තැබීම ඇරඹේ.

### හත් අඩියට අළුවන් වැඩීම

පස් පැඟිරි සහිත අළු බිම අතුරා ඒ මත නවග්‍රහයින්ට අදාළ කවි කියමින් අක්ෂර පිහිටුවති. සත් දින නාමයන්ගේ මුල් අකුරු ග්‍රහ අක්ෂර ලෙස සැලකේ. එක් එක් අක්ෂරයක් ලියා ඒ මත ඊට අදාළ වූ කෝල්මුර කියමින්

1. රඹ පතුරු
2. පියුම් 7
3. පඬුරු සහිත බුලත්
4. අයිල හෙවත් නවගහ යක්ෂයින් උදෙසා බත් ගොටු
5. දෙක බැගින් දෙහි 14ක්
6. පහන් තිර

ආදී සියල්ල නියමිත ස්ථානයේ තැන්පත් කර දුම්මල දිෂ්ටි ගැසීම සිදු කරන්නේ කවි ගායනා මධ්‍යයේය. වින කැපීමට හත් අඩිය ශාන්තිය යොදා ගත්තද නුවරකලාවියේ නවග්‍රහ බලි ශාන්තියේදී ද අතුරු පුජාවක් ලෙසට මෙය යොදාගන්නේ ආතුරයාට බලපානු ලබන ග්‍රහ දොස් හේතුවෙන් කිසිවකු වින කර තිබේ නම් එයද හරණය වනු පිණිස බව ඇදුරන්ගේ මතයයි.

### ගිරය පේ කිරීම

හත් අඩිය තැබීමෙන් පසු ගිරය පේ කිරීමට කෝල්මුර කවි කීම ඇරඹේ. එහිදී ගිරේ උපත පිළිබඳ කෝල්මුර කවි ගායනයෙන් අනතුරුව හත් අඩියේ දෙහි කැපීම අරඹති.

### හත් අඩියේ දෙහි කැපීම

නිල අනුව දෙහි කපා අනතුරුව ගිරය රෝගියා අතට දී අතින් ගිලිහෙන ගිරය තැන්පත්වන ස්ථානය අනුව රෝගී දෝෂය විනිශ්චය කිරීමට නුවරකලාවියේ බලි ඇදුරෝ සමත් වෙති.

### සබානැටුම් නැටීම

ඊළඟ පියවර වන්නේ ඇදුරන් සබා නැටුම් නැටීම ආරම්භ කිරීමයි.

### මොට්ටැක්කිලි ඇරීම

ආතුරයා වසා ඇති මොට්ටැක්කිලියට කවි කියා මොට්ටැක්කිලි ඇරීම සිදු කරති.

### ග්‍රහ වලල්ල බැලීම හා ආවැඩීම

ආතුර මොට්ටැක්කිල ඉවත් කිරීමෙන් පසුව ග්‍රහ වළල්ල බැලීමට සලස්වන අතරතුර නවග්‍රහ පංතියට අදාළ කවි ගායනය ඇරඹේ. එහිදී අතුරයාට ආවැඩීමට කිසිවිටක අමතක නොකරති. එය උක්ත ශාන්තිකර්මයේ සම්ප්‍රදායයි.

### ආතුරයා අත පිරිත්තුව තැබීම

පිරිත්තුවට කවි කියා ආතුරයා අත පිරිත්තුව තැබීම ඊළඟ පියවර වේ.

### මංගල කවි කීම

නවග්‍රහ ශාන්තියේ මූලික කටයුතු නිමාවන්නේ මංගල කවි ගායනයෙනි. මෙහිදී ද ආතුරයාට ආවැඩීම හා ආශිර්වාද කිරීම නොනවත්වා සිදු කරති.

### ආතුර වාසස්ථානයෙන් ආතුරයා නඟා සිටුවීම

මංගලාෂ්ඨක ගායනයෙන් පසුව ආතුරයා වාසස්ථානයෙන් නඟා සිටුවයි. ඉන් මධ්‍යම සමයම නිමාවේ.

### අලුයම් සමයම ඇරඹීම

නුවරකලාවියටම ආවේණික පූජා විධි රැසක් අලුයම් සමයමේදී හඳුනාගත හැකිය.

### දේවාරූඪය

තත් ශාන්ති කර්මයන්හිදී ප්‍රධාන කපු මහතා ඉස් සෝදා නා පිරිසිදු වී දේවාභරණ පැලඳ දේවාරූඪය සඳහා සූදානම් වේ. රත්නකම්බිලි කළුකම්බිලි සඳුන්කුමාර පත්‍රකාලි නම් දෙවිවරුන්ගේ ආරූඪය අනුව සියලු ක්‍රියා සිදුකළ අතර එක් දේවාරූඪයක් නිමා වීමත් සමඟම තවත් ආරූඪයක් පැමිණේ. අනෙකුත් ඇදුරෝ උඩැක්කි අතැතිව එක් එක් දෙවියන්ට අදාළ අභිනපද වාදනය හා කෝල්මුර ගායනය නොනවත්වා සිදු කරති.

### යහන්වලට දිෂ්ටි ගැසීම

නැවතත් ආතුරයා යාග මණ්ඩපයට කැඳවන්නේ දේවාරූඪයෙනි. සියලු යහන් වලට දුම්මල දිෂ්ටි ගසා යහපත් දෙවිවරුන් යහන්වලට කැඳවීමත් අයහපත් බලවේග පලවා හැරීමත් සිදුකෙරේ.

### ගොටු කැප කිරීම

දේවාරූඪ වූ ඇදුරා ආතුරයා සහ පවුලේ සියලු දෙනා යාග මඩුවට ගෙන්වා

ගොටු කැපකිරීම අරඹයි. එහිදී කම්බිලි දෙවියන්ට ගොටු දෙකක් ද කඩවර දෙවියන්ට ගොටු දෙකක් ද රීරි යක්ෂයාට කුකුල් බිල්ල ද සූනියම් දෙවියන්ට රීරි තනි ගොටුවක් ද ආදී වශයෙන් දුම්මල දිෂ්ටි ගසමින් කැපකර දීම මෙහිදී දකින්නට ලැබේ.

### *පැදුරේ සමයන් දීම*

නුවරකලාවිය නවග්‍රහ බලිශාන්ති කර්මයට ආවේණික මෙම පූජා කර්මය ද ලංකාවේ අනෙකුත් බලි ශාන්තිකර්මයන් තුළ දක්නට නොමැත. කඩවර ප්‍රමුඛ 67 ත් කට්ටුව, කම්බිලි දෙවි ප්‍රමුඛ 500ක් පියවර, සූනියම් යක්ෂයා ප්‍රමුඛ 6500ක් පිරිවර, නවග්‍රහ යක්ෂයින් 500ක් දෙනාට උඩැක්කි කෝල්මුර ගායන මධ්‍යයේ ආරාධනා කර ප්‍රධාන ඇදුරා පැදුරේ සමයන් දීමට සැරසේ. පැදුරට කවි කියා පැදුරක් එළා ඒ මත උඩුකුරුව දිගාවන ඇදුරා ඉස සිට දෙපය දක්වා රත සළුවක් පොරවා කඩවර, කම්බිලි, නවග්‍රහ, සූනියම් ආදී වූ යක්ෂයින් උදෙසා කැප කළ ගොටු සියල්ල පන්දම් සහිතව කොරහක තැන්පත් කර උදරය මත ද කුකුළු බිල්ල දෙපා අභියස ද තබා ගනිමින් සියලු යක්ෂයින්ට අඬ ගසා ආතුරයා නිදහස් කරන ලෙස ඉල්ලමින් සියලු දොළ පිදේනි පුද දෙති.

### *ආතුරයාට ආශිර්වාද කිරීම*

පරහඳ ගා ආතුරයාට පිරිත් පැන් බොන්නට දී පිරිත් නූල් ගැට ගසා යන්ත්‍ර පැලඳීමත් පැමිණ සිටින සියල්ලන්ට පරහඳ ද, පිරිත් පැන් හා පිරිත් නූල් ද දී සෙත් ශාන්ති ආශිර්වාද ලබා දීමත් ප්‍රධාන ඇදුරා අතින් සිදු කෙරේ. ආතුරයා නවරත්න කළයේ ඖෂධීය ජලයෙන් ස්නානය කරවීම තවත් විශේෂත්වයකි.

### *යකුන් උදෙසා තුන්මංසලේ ගොටු කැපකොට දීම*

මෙය උක්ත ග්‍රහ ශාන්තියේ අවසන් පූජා කර්මයයි. ඇවරි කණු 4ක්, කදුරු කණුවක්, කුකුළු බිල්ලක්, යකුන්ට හා දෙවියන්ට කැප කර දුන් ගොටු සහ තටු සියල්ලත් දුම්මල, පන්දම්, ගිනි කබල් බුලත් හා පුවක් 7 බැගින් ද ගෙන සෙසු ඇදුරෝ තුන්මන්සලකට යති. එහිදී මෙම ගොටු සෙනෙවිරත්න මුල්කඩවරට ගොටු දෙකක්ද කම්බිලිට ගොටු දෙකක්ද සූනියම්ට ගොටුවක් ද අනෙකුත් ගොටු තටු සියල්ල ද බුලත් යහන මත තබා කුකුළු රීරි ද සමඟ කෝල්මුර පූජා මධ්‍යයේ රීරි කඩවරට කැප කර දෙති. අනතුරුව පූජා කර්මය නිමා වේ.

### *නිගමනය*

රෝග නිවාරණය හා මානසික සන්තුෂ්ටිය උදෙසා මිනිසා සතුව පවත්නා අදෘශ්‍යමාන බලවේගයන් තුළින් රැකවරණය ආරක්ෂාව පිහිට අපේක්ෂා කිරීමේ කර්තව්‍යය තුළ අන්තර්ගත අභ්‍යන්තර හර පද්ධතිය සුළු කොට තැකිය යුතු නොවේ. එක්ව ක්‍රියා කිරීම, සමඟිය, චිත්ත ශක්තිය වර්ධනය වීම, සමාජ සන්නිවේදනය, සොබාදහම හා ඇති බැඳියාව තහවුරු වීම, මානසික ඒකාග්‍රතාවට පත් වී සුවපත් වන මනස තුළින් ශාරීරික අපහසුතා මඟ හැරීමේ මානසික රෝග නිවාරණයක් ලෙසට මෙම ශාන්තිකර්මයන් තුළ පවත්නා වටිනාකම අගය කළ යුතුය. එමෙන්ම දේශීය පාරම්පරික ජන විඥානය සහ සංස්කෘතිකමය වටිනාකම අගය කිරීම හා රැක ගැනීම ඒ තුළින් ඉස්මතු වන යථාර්ථයයි.

## ඡායාරූපාවලිය



පේ බත නොහොත් තොවිල් දානය



සැකසූ දේවයහන්/පිදේනි



හත් අඩිය ආරම්භ කරමින්



හත් අඩිය ශාන්තිය



ආතුරයාට දෙහි කැපීම



පැදුරේ සමයම් දීම



නවග්‍රහ තටු සැකසීම



රත්න කළය



සූනියම් දේවතා යහන



නවග්‍රහ කඩ බලිය